# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1452/24 - 2006 ජූලි 07 වැනි සිකුරාදා - 2006.07.07

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. බී. 21/78.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නියමය

අධ්‍යාපන අමාත්‍ය අච්චිගේ දොන් සුසිල් ප්‍රේමජයන්ත වන මම, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයට අදාළව 1995 නොවැම්බර් මස 7 වන දින අංක 896/2 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද, ඉහත කී පනතේ 21 වන වගන්තිය යටතේ කරන ලද නියමය, විශ්වවිද්‍යාල කොමිෂන් සභාවේ නිර්දේශය මත, 2006 අප්‍රේල් මස 24 වන දින සිට බලපැවැත්වෙන ලෙස පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරමි.

(1) ඒ නියමයේ (iv) වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ජේළි ආදේශ කිරීමෙන්.–

"(iv) ඒ විශ්වවිද්‍යාලයට පහත සඳහන් පීඨයන් පවරමි.

1. සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය ;
2. කළමනාකරණ අධ්‍යයන පීඨය ;
3. කෘෂිකාර්මික විද්‍යා පීඨය ;
4. ව්‍යවහාරික විද්‍යා පීඨය ;
5. වෛද්‍ය සහ සමාන්තර විද්‍යා පීඨය " ; සහ

(2) ඒ නියමයේ උපලේඛනය වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කිරීමෙන් .–

1A – G 007267—1,000 (2006/07)

"උපලේඛනය

| *1 වන තීරය* | *2 වන තීරය* |
|---|---|
| සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය | 1. සමාජ විද්‍යා අධ්‍යයන අංශය<br>2. මානව ශාස්ත්‍ර අධ්‍යයන අංශය |
| කළමනාකරණ අධ්‍යයන අංශය | 1. ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයන අංශය<br>2. ගණකාධිකරණ හා මූල්‍ය අධ්‍යයන අංශය |
| කෘෂිකාර්මික විද්‍යා පීඨය | 1. වැවිලි කළමනාකරණ අධ්‍යයන අංශය<br>2. උද්‍යාන විද්‍යා අධ්‍යයන අංශය<br>3. ආහාර තාක්ෂණ විද්‍යා අධ්‍යයන අංශය |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 1. ජීව විද්‍යා අධ්‍යයන අංශය<br>2. භෞතික විද්‍යා අධ්‍යයන අංශය<br>3. කාර්මික කළමනාකරණ සහ පරිගණක විද්‍යා අධ්‍යයන අංශය<br>4. ගෘහ විද්‍යා අධ්‍යයන අංශය |
| වෛද්‍ය සහ සමාන්තර විද්‍යා පීඨය | 1. කාය ව්‍යවච්ඡේද අධ්‍යයන අංශය<br>2. භෞතවේද අධ්‍යයන අංශය<br>3. ජීව රසායන විද්‍යා අධ්‍යයන අංශය" |

අච්චිගේ දොන් සුසිල් ප්‍රේමජයන්ත,
අධ්‍යාපන අමාත්‍ය.

2006 ජූනි මස 30 වැනි දින,
කොළඹ දී ය.

07 - 413

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදි.